# කෝට්ටේ යුගයේ ශාස්ත්‍ර නිකේතන හා අධ්‍යාපනික ප්‍රවණතා

ගුණවර්ධන කාතායත්කාර

Kotte period is charateristic for quality literary works in Sinhala. There were eminent authors who engaged in writting on a varaity of subjects. Moreover this period was never short of academically reputed institutions. The emergence of an outstanding literary tradition of Sinhala was a result of such reputed schools as Vijayaba Pirivena of Thotagamuwe and Padmawathi Piriena of Keragala. In addition, the royal patronage was highly addition; the royal patronage was highly remarkale in bringing up such brilliant standard in the literary works of this era. All in all the diligent endeavor of the learned, the encouragement given by the royalty, and the peaceful atmosphere that prevailed during the time gave way to such a prominant literary tradition.

කෝට්ටේ යුගය සිංහල සාහිත්‍ය ඉතිහාසයේ අතිශය දීප්තිමත් අවධියකි. තත්කාලීන අධ්‍යාපනික සංවර්ධනය එම අභ්‍යුදය සඳහා ප්‍රධාන හේතුව විය. කිසියම් කාල පරිච්ඡේදයක් අධ්‍යාපනය අතින් නොදියුණු නම් එම යුගයේ සෑම අංශයක ම දිස්වන්නේ පරිහානි ලක්ෂණ යි. ඕනෑම යුගයක් දියුණුව කරා පිය මං කරන්නේ අධ්‍යාපනික සංවර්ධනය මුල් කරගෙනය. එමෙන් ම ක්‍රමානුකූල අධ්‍යාපනයක් සකස් වන්නට දේශපාලනික වාතාවරණය ඉඳුරාම බලපායි. සාමකාමී දේශපාලන තත්වයක් රටේ පවත්නා විට වියතුනට අධ්‍යාපනික කටයුතු විවේකීව කරගෙන යාමට අවකාශ සැලසේ.

හයවැනි පැරකුම්බා රජුගේ රාජ්‍ය කාලය තුළ පැවති සාමකාමී දේශපාලන වාතාවරණය නිසාත්, රාජානුග්‍රහය නිසාත්, කෝට්ටේ යුගයේ සාහිත්‍යය දියුණු වන්නට පටන් ගති. එකල උසස් අධ්‍යාපන ආයතනවලින් හෝ විදග්ධ පඬිවරුන්ගෙන් හෝ ශාස්ත්‍රලාභීන්ගෙන් හෝ හිඟයක් නොවීය. විදේශ රටවල අය පවා උසස් අධ්‍යාපනය